කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහා භාණ්ඩාගාරය, කොළඹ 01. பொது திறைசேரி, கொழும்பு 01. General Treasury, Colombo 01.

මගේ අංකය / எனது இல. / My No. DMS/POL/Bud.Pro./2026-I
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026.06. 12

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ප්‍රධානීන්,

**2026 අයවැය අනුව, රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2026.04.30 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2026 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එමගින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 සහ 25/2014 (I) නැවත බලාත්මක කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 ප්‍රකාරව, 2019.09.01 දිනට සුදුසුකම් සපුරා ඇති සක්‍රීය සේවයේ යෙදී සිටින සේවකයින්ගේ පත්වීම් ස්ථිර කිරීමට අනුමැතිය ලබා දී ඇත.

03. ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2026 හි 07 ඡේදයෙහි විධිවිධානවලට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 සහ 25/2014 (I) ප්‍රකාරව ස්ථිර පත්වීම් ලබා දී තනතුරු අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණ ද, මෙතෙක් තනතුරු අනුමත කර නොමැති ඉල්ලීම් සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලා ඉදිරි පියවර ගත යුතු වේ.

04. ඒ සඳහා, දැනටමත් ඔබ විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014 (I) යටතේ විධිමත් පරිදි ස්ථිර පත්වීම් ලබා දී කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම්, ආයතනික මට්ටමින් නැවත පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන සේවකයින්ගේ තොරතුරු හා පූර්ව ලිපි ගොනු සම්බන්ධය ද සඳහන් කරමින්, ඇමුණුම් අංක 01හි ආකෘතිය ප්‍රකාරව **2026.07.30** දිනට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු වේ.

කාර්යාලය / அலுவலகம் / Office 011- 2484757, 011- 2484640
ෆැක්ස් / தொலைநகல் / Fax 011- 2430270, 011- 2484846
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail dgms@msd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.treasury.gov.lk

05.එසේම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2026 යටතේ විධිමත් පරිදි ස්ථිර පත්වීම් ලබා දී, අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සඳහා ගැළපුම් කර ඇති සහ අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු නොමැති නමුත්, දරන්නාට පෞද්ගලික වන සේ තනතුරු අනුමත කළ යුතු සේවකයින්ගේ තොරතුරු **ඇමුණුම 02** හි සඳහන් පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ නිර්දේශය සහිතව **2026.07.30** දිනට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය.

06. තවද, 2019.09.01 දිනෙන් පසුව රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන ඇති සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා **2019.09.01** දින සිට **2026.04.27** දින දක්වා රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය හා ව්‍යවස්ථාපිත ආයතනවල තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන ඇති සක්‍රීය සේවයේ යෙදී සිටින සේවකයන් පිළිබඳ තොරතුරු **ඇමුණුම 03** හි සඳහන් පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ නිර්දේශය සහිතව **2026.07.30** දිනට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය.

07. උක්ත 06 ඡේදය යටතේ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී, අංක අමප/24/0756/605/006-1 හා 2024.06.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PL/6/2/36/T-1 හා 2024.06.25 දිනැති ලිපියේ උපදෙස් පරිදි, 2023.08.29 දිනට දින 180ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත පළාත් පාලන ආයතනවල සේවයේ යෙදෙන සේවකයින් ඇතුළත් නොවිය යුතු බව කාරුණිකව දන්වමි.

08. ඉහත සඳහන් ඇමුණුම්වල මෘදු පිටපත් (Soft Copies), cadreinformation@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිව දන්වා සිටිමි.

**එම්.කේ.ඩී.එන්. මාදම්පෙ**

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

I. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
II. ලේකම්, මුදල් කොමිෂන් සභාව

} - කරු, දැ.ගැ.පි.

ඇමුණුම 01

**රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගෙන සිටි සේවකයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 සහ 25/2014 (I) හි විධිවිධාන ප්‍රකාරව ස්ථිර පත්වීම් ලබා දෙන ලද නමුත්, මෙතෙක් තනතුරු අනුමත කිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා දී නොමැති සේවකයින් පිළිබඳ තොරතුරු**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව/ආයතනය - ......................................................................................

| අනු අංකය | ස්ථිර කරන ලද සේවකයන්ගේ තොරතුරු | | | | බඳවා ගත් දිනය | බඳවා ගෙන ඇති පදනම (තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම ) | ස්ථිර පත්වීම් ප්‍රදානය කළ දිනය | තනතුර |
|---|---|---|---|---|---|---|---|---|
| | නම | උපන් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | බඳවා ගත් තනතුර | | | | |
| 01 | | | | | | | | |
| 02 | | | | | | | | |
| 03 | | | | | | | | |
| 04 | | | | | | | | |
| 05 | | | | | | | | |

රාජ්‍ය අංශයේ ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **11/2026** හි විධිවිධාන ප්‍රකාරව ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලද සේවකයන් පිළිබඳ තොරතුරු

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව/ආයතනය - ..............................................................................

| අනු අංකය | ස්ථිර කරන ලද සේවකයන්ගේ තොරතුරු | | | | බඳවා ගෙන ඇති පදනම (තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම ) | ස්ථිර පත්වීම් ප්‍රදානය කළ දිනය | තනතුර | පවතින පුරප්පාඩු අනුව ගැළපීම | දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කළ යුතු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | නම | උපන් දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | බඳවා ගත් තනතුර හා දිනය | | | | | |
| 01 | | | | | | | | | |
| 02 | | | | | | | | | |
| 03 | | | | | | | | | |
| 04 | | | | | | | | | |
| 05 | | | | | | | | | |

ඇමුණුම 03

**2019.09.01 දින සිට 2026.04.27 දින දක්වා රාජ්‍ය අංශයේ ආයතනවල සක්‍රීය සේවයේ යෙදී සිටින තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත සේවයට බඳවාගත් සේවකයන් සම්බන්ධයෙන් තොරතුරු**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව/ආයතනය - ..............................................................................................

| අනු අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | බඳවා ගත් තනතුර හා පත්වීම් ලිපිය නිකුත් කළ ගොනු අංකය | පත්වීම් දිනය | බඳවාගනු ලැබූ වැටුප/ දීමනාව | බඳවා ගෙන ඇති පදනම (තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම ) | සක්‍රීය සේවයේ යෙදී සිටි සේවා කාලය |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | |
| 02 | | | | | | | |
| 03 | | | | | | | |
| 04 | | | | | | | |
| 05 | | | | | | | |